## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2017

-----------------------------------------------

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2018 ජුලි 05 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය ව්‍යාචනය

---------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**
**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1**
**-------------------------------**

(i) ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසරදී ඇති විටෙක හැර වත්කම් වගකීම්වලට හිලව්කර දැක්විය නොහැකි නමුත්, 2017 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගේ හර ශේෂය වූ රු.169,871,122 කට එදිනට ණයගැතියන්ගේ රු.286,918 ක බැර ශේෂය හිලව්කර ශුද්ධ ණයගැතියන් රු.169,584,204 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) වර්ෂ 5 ක කාලයකට තාවකාලිකව පවරා ගෙන තිබුණු සළුසල සතු ගොඩනැගිල්ලක් වැඩිදියුණු කිරීම සඳහා සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණු රු.2,746,581 ක් ප්‍රාග්ධනගත කිරීමට හා සමාලෝචිත වර්ෂයේ සිට වර්ෂ 5 ක් තුළදී ලාභයට එරෙහිව කපා හැරීමට කටයුතු කර තිබුණු නමුත්, ප්‍රමිතයේ 117 ඡේදය ප්‍රකාරව එම ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**
**------------------------------------**

ප්‍රමිතයෙහි 9 ඡේදය ප්‍රකාරව ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රත්‍රන් තොගයේ වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට දැක්විය යුතු වුවත් ඊට පටහැනිව 2012 වර්ෂයේදී තක්සේරු කරන ලද වටිනාකම වූ රු.3,912,465 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** 19
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදම වූ රු.3,425,836 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් ප්‍රමිතයේ 76 ඡේදය ප්‍රකාරව, එම වටිනාකම ගණනය කිරීමට අදාළ වූ උපකල්පන හෙළිදරව් කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** 24
----------------------------------

ප්‍රමිතයේ 17 ඡේදය ප්‍රකාරව, සංස්ථාවේ ඉහළ කළමනාකරණය වෙත ගෙවන කෙටි කාලීන සේවක ප්‍රතිලාභ, වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ඔවුන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික පමණක් හෙළිදරව් කර තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39**
----------------------------------

(i) ප්‍රමිතයේ 63 ඡේදය ප්‍රකාරව, 2017 දෙසැම්බර් 31 දිනට රු.169,584,204 ක් වූ වෙළඳ ණයගැතියන්ගේ ක්‍රමක්ෂය පිරිවැය මැනීමකින් තොරව රු.2,912,820 ක් බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 46 ඡේදය ප්‍රකාරව, සේවක ණය හා ලැබියයුතුදෑ සඵල පොලී අනුපාතික ක්‍රමය උපයෝගීකර ගෙන ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇති බව හෙළිදරව් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ රු.22,944,095 ක් වූ සේවක ණය ක්‍රමක්ෂය පිරිවැයට දක්වා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2017 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණනය නොකරන ලද නමුත් තවදුරටත් භාවිතයේ පවතින වාහන 5 කට අදාල පිරිවැය හා එදිනට වූ සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.3,256,967 ක් හා රු.3,226,551 ක් ගිණුම්වලින් ඉවත්කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් වෙනස්කම් සඳහා පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

| | ලෙජර් ගිණුම අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විකුණුම් ආදායම | 578,893,084 | 593,369,128 | 14,476,044 |
| ණයහිමියෝ | 29,968,930 | 31,563,111 | 1,594,181 |

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබිය යුතු වටිනාකම් | 152,954 | ශේෂ සනාථන |
| (ආ) | ණයගැති ශේෂ | 142,018,470 | ණයගැති ශේෂ 31 සඳහා ශේෂ සනාථන |
| (ඇ) | ගංවතුර ආධාර සඳහා වියළි ආහාර මළු 1,000 ක් පරිත්‍යාග කිරීම | 1,999,659 | රත්මලාන සතොස ආයතනය වෙතින් ලබා ගෙන තිබුණු වියලි ආහාර ද්‍රව්‍ය භාරගත් බවට යොදා ඇති අත්සන්වලට අදාළ නිලධාරීන්ගේ නම් හා තනතුරු හා මෙම කාර්යය සඳහා සහභාගී වූ නිලධාරීන් පිළිබඳ තොරතුරු |
| (ඈ) | අමු ඖෂධ ඉතිරි තොගය, නිමි ඖෂධ ඉතිරි තොගය,ඇසුරුම් ද්‍රව්‍ය ඉතිරි තොගය, නොනිමි තොගය, ලිපි ද්‍රව්‍ය හා ඇඩි තෙල් ඉතිරි තොගය හා යන්ත්‍ර අමතර | 200,507,347 | 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග භෞතික සමීක්ෂණ කටයුතු නිරීක්ෂණය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව සහභාගී කර නොගැනීම හේතුවෙන් ඉතිරි තොගයේ අගයන් පිළිබඳ සෑහීමකට පත්විය |

කොටස් ඉතිරි තොගය                                    හැකි තොරතුරු

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.169,584,204 ක්වූ මුළු ණයගැති ශේෂයන් සියයට 1.41 ක් වූ රු.2,394,142 ක ණයගැති ශේෂ 14 ක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට රාජ්‍ය අංශයේ ආයතන 14 ක අයවීම් හිඟ හිටි ණය ශේෂ වූ අතර ඉන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගෙන නොතිබුණි.

(ආ) මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් හා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු වර්ෂ 6 ත් වර්ෂ 7 ත් අතර කාලයක සිට හිඟහිටි රු.76,870 ක් හා රු.12,000 ක් සම්බන්ධයෙන් ලැබී තිබුණු ණයගැති ශේෂ සනාථ කිරීම්වලට අනුව පියවීමට කිසිදු ශේෂයක් නොමැති බව දන්වා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු ණයහිමි ශේෂය රු.31,563,111 ක් ශේෂ සනාථ කිරීම් මගින් තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ තුළ පැවති ණයහිමි ශේෂ 40 කට අදාළ රු.11,981,221 ක ණය ගෙවීමේ ප්‍රමාද කාලය දින 376 ත් දින 1,928 ත් අතර කාල පරාසයක් ගෙන තිබුණි. ඒ අතර රු.2,663,454 ක ණය ශේෂ 4 ක් අර්බුදකාරී ණය ගනුදෙනුවලින් පැන නැගී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය තුළදී වැඩ තහනම් කරන ලද සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.932,271 ක හා සමාලෝචිත වර්ෂය තුළදී සේවය අතහැර ගිය එක් සේවකයකුගෙන් අයවිය යුතු රු.18,884 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 08 වන ඡේදය | වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර එම වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු නමුත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය සඳහා වර්ෂය ආරම්භවී දින 25 කට පසු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.1.2 හා 13.4 වගන්ති හා 2003 ජුනි 02 දිනැති | තනතුරු නාම 11 ක් යටතේ අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා, සුදුසුකම් නොමැති නිලධාරීන් 26 දෙනෙකු වෙත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව වැඩ බැලීමේ පත්වීම් ලබාදී |

| | |
|---|---|
| පිඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය | තිබුණි. වැඩ බැලීමේ තනතුරක කාලය උපරිම මාස 03 ක් විය යුතු වුවත්, මාස 09 ත් මාස 60 ත් අතර කාලයක් එම නිලධාරීන් 26 දෙනා වෙත වැඩ බැලීමේ දීමනා ලෙස 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී එකතුව රු.2,237,571 ක් ගෙවා තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------------------- | |
| (i) මුදල් රෙගුලාසි 103 | 2007 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී හඳුනාගෙන තිබුණු රු.13,472,021 ක් වූ තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම කාලය තුළදී හඳුනාගෙන තිබුණු රු.16,225,809 ක් වූ තොග අතිරික්තතා පොත්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 237(ඈ) | (i) රාජකාරී ගමන් සඳහා සංයුක්ත දීමනා ගෙවීම වෙනුවට නවාතැන් හා ආහාර සඳහා සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂකවරයා විසින් පෞද්ගලිකව වැය කරන ලද රු.35,364 ක් සංස්ථාවේ වියදමක් ලෙස සළකා ප්‍රතිපූර්ණය කර තිබුණි. යොමුගත රෙගුලාසි පරිදි සේවාව හෝ වියදම සඳහා බලය දෙන හෝ අනුමත කරන නිලධාරියාගේ සහතිකය හෝ අනුමැතිය හෝ නියෝගය වවුචරයේ හෝ අදාළ කුවිතාන්සියේ දක්වා නොතිබියදී එම ගෙවීම් සිදුකර තිබුණි. |
| | (ii) තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබාගෙන සිදු කරන ලද කාර්යයන් 7 ක් වෙනුවෙන් වැයකර තිබුණු රු.53,620 ක් සඳහා නියම බිල්පත් වෙනුවට ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර තිබියදී අග්‍රිම පියවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371 (ආ) හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගත් කාර්යය නිමකළ විගසම අග්‍රිමය නිරවුල් කළ යුතු නමුත්, ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ නිලධාරීන් 20 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.186,483 ක තත්කාර්ය අතුරු අග්‍රිමයන් 2018 මාර්තු 31 දින වන විටද පියවා නොතිබුණු අතර එදිනට ප්‍රමාද කාලය මාස 01 ක සිට මාස 28 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 392 (ආ) | 2017 නොවැම්බර් 20 දින අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයුම්) වෙත ලියා තිබුණු නමුත් පසුව අස්ථානගතවී තිබුණු රු.399,360 ක චෙක්පත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන වටිනාකම රු.983,174,296 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්මේ හා වාර්ෂික අයවැය ලේඛනයේ පිටපතක් සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර |

දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම අවශ්‍යතාවන්ට පටහැනිව 2017 වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය සමාලෝචිත වර්ෂය ආරම්භවී මාස 03 කට ආසන්න කාලයක් ප්‍රමාදවී 2017 මාර්තු 20 දින ඉදිරිපත් කර තිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක්, තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට සංස්ථාවලට හැකියාව තිබේ. සංස්ථාව මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 1997 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දිරි දීමනා ක්‍රමවේදය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බවට 2007 නොවැම්බර් 09 දින පවත්වා තිබුණු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කර තිබුණු නමුත් 2018 මාර්තු 28 දින වන විටත් එම අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම දිරි දීමනා ක්‍රමය තුළ නිෂ්පාදන පිරිවැය මත පදනම්ව නිෂ්පාදන දිරිදීමනා, පැමිණීමේ දීමනා, ඉතිරි වෛද්‍ය නිවාඩු දීමනා හා ඵලදායිතා දිරිදීමනා වශයෙන් වර්ග 04 ක දිරි දීමනා ඇතුළත් වන අතර වෙළඳපල උද්ධමනකාරී තත්ත්වයක් තුළ නිෂ්පාදන පිරිවැය වාර්ෂිකව වැඩිවන බැවින් එම දිරිදීමනාවද වාර්ෂිකව වැඩි වන නිසා දිරි දීමනා ක්‍රමයකින් අපේක්ෂිත සේවක කාර්යක්ෂමතාවය වැඩි වෙයැයි අපේක්ෂා කළ නොහැකිවේ. සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ පහකදී මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණු මුළු දිරි දීමනාවල එකතු අගය රු.307,785,384 ක් විය.

(ආ) 1987 නොවැම්බර් 19 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ආවේනික වූ පරිපාලනමය හා පාලන රෙගුලාසි ඇතුළත් කරමින් නිවාඩු කාර්යය පරිපාටියක් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණු නමුත් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු බැවින් එම නිවාඩු කාර්යය පරිපාටිය වෙනුවට 2009 ජනවාරි සිට ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ භාවිතා කළ යුතු බව 2009 පෙබරවාරි 16 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. එසේ නමුත් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ අනුගමනය නොකර ඒ වෙනුවට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු නිවාඩු කාර්යය පරිපාටිය අනුව ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිවාඩු දීමනා ලෙස එකතුව රු.18,292,241 ක් සංස්ථාව විසින් නිලධාරීන් හා සේවකයන් වෙත ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.43,656,859 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.35,630,966 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.8,025,893 කින් වර්ධනය වී

තිබුණි. ආදායම් බදු වියදම රු.4,954,202 කින් වැඩිවී තිබුණද ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් රු.12,530,504 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.30,978,577 ක අතිරික්තය 2014 වර්ෂයේදී රු.7,968,428 ක් දක්වා අඩුවී 2015 වර්ෂයේදී රු.41,058,076 ක් දක්වා නැවත වැඩිවී තිබුණි. 2016 වර්ෂයේදී රු.35,630,966 ක් දක්වා අඩුවී තිබුණු අතිරික්තය 2017 වර්ෂයේදී රු.43,656,859 ක් දක්වා වැඩි වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සහ බදු වියදම නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.156,301,920 ක් වූ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු.260,300,385 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 1.87 කින් හා සියයට 1.25 කින් අඩු ප්‍රතිශතයකින් වැඩි වී තිබුණු අතර ජංගම අනුපාතය සියයට 2.87 කින් අඩුවී තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 100 ක් වූ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් 09 මෙන්ම රු.30,994,032 ක් වැයකර වීදුරු බෝතල් 1,055,572 ක් මිලදී ගැනීමේ හා රු.3,898,000 ක් වැයකර බෝතල් මුඩි 900,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයන් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද අමු හා වියලි ඖෂධ, තෙල් හා දියර වර්ග සහ ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රමාණයන් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද ආයතන සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය, වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම හා කාල රාමුව හා අපේක්ෂිත නිමවුම/ප්‍රතිඵල යනාදී විස්තරද, භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට සීමාවූ ක්‍රියාකාරකම් හැර සංස්ථා අරමුදලින් වැයකිරීමට අපේක්ෂිත මූලධන වියදම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ නිෂ්පාදන සැලැස්මේ හා අලෙවි සැලැස්මේ ඇතුළත් සැලසුම් ඉටු කිරීමට අදාළව සංස්ථාවේ අනෙකුත් අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.100,000,000 ක් වූ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් 09 න් කිසිදු ක්‍රියාකාරකමක් 2018 මාර්තු 28 දින වන විටත් නිමකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව අපේක්ෂිත නිෂ්පාදනය, තත්‍ය නිෂ්පාදනය හා විචලනයන් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, නව නිෂ්පාදන නොවන නිෂ්පාදන 09 ක සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 69,201 ක් සහ මිලි ලීටර් 750 බෝතල් 654,415 ක් වුවද, තත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 65,815 ක් හා මිලි ලීටර් 750 බෝතල් 453,804 ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් කිලෝග්‍රෑම් 3,386 කින් හා මිලි ලීටර් 750 බෝතල් 200,611 කින් ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම මෙම නිෂ්පාදන 09 සඳහා අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය රු.303,341,030 ක් වුවද, තත්‍ය නිෂ්පාදන පිරිවැය රු.324,033,605 ක් වූයෙන් අවාසිදායක විචලනය රු.20,692,575 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, නව නිෂ්පාදන 20 ක සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය ලීටර් 21,337 ක්, කිලෝග්‍රෑම් 7,370 ක් හා ඒකක 119,866 ක් වුවද, තත්‍ය නිෂ්පාදනය ලීටර් 8,051 ක්, කිලෝග්‍රෑම් 3,396 ක් හා ඒකක 146,569 ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් ලීටර් 13,286 ක් හා කිලෝග්‍රෑම් 3,974 කින් ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත් ඒකක වලින් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණු ඖෂධවලින් අපේක්ෂිත ඒකක ප්‍රමාණයට වඩා ඒකක 26,703 ක් වැඩියෙන් නිෂ්පාදනය කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු මුළු නිෂ්පාදන පිරිවැය රු.3,974,675 ක් වූ නව නිෂ්පාදන වර්ග 28 ක ඒකක 47,315 ක්, ලීටර් 2,389 ක් හා කිලෝග්‍රෑම් 32 ක් නිෂ්පාදනය කර තිබුණි. එසේම මෙම නිෂ්පාදන වර්ග 28 න් වර්ග 14 ක සියයට 50 ට වැඩි තොග ඉතිරිවී තිබුණි. සැලසුමකින් තොරව නිෂ්පාදනය කර තිබුණු මෙම නිෂ්පාදනයන් සිදු කිරීමට අධිකාරී බලය ලැබී තිබුණු බව තහවුරු නොකෙරුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී දේශීය ඖෂධ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල වාර්ෂික අලෙවි සැලැස්ම, තත්‍ය අලෙවිය හා විචලනයන් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අලෙවි සැලැස්මට අනුව ඇස්තමේන්තුගත අලෙවි ආදායම රු.929,430,375 ක් වුවත් එම ඇස්තමේන්තුව පිළියෙල කිරීමට පදනම් කර ගත් මූලාශ්‍ර තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ii) ඉකුත් වර්ෂයේදී රාජ්‍ය අංශය තුළ අපේක්ෂිත අලෙවි ආදායමෙන් ළඟා කරගත නොහැකිවී තිබුණු ආදායම රු.154,667,424 ක් එනම් සියයට 26 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ළඟා කර ගත නොහැකිවී තිබුණු එම ආදායම රු.79,984,655 ක් එනම් සියයට 15 ක් දක්වා අඩු වී තිබුණි. එසේම ඉකුත් වර්ෂයේ පෞද්ගලික අංශයේ අපේක්ෂිත ආදායමෙන් ළඟාකරගත නොහැකි වී තිබුණු

ආදායම රු.280,633,384 ක් එනම් සියයට 69 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ළගාකර ගත නොහැකි වී තිබුණු එම ආදායම රු.256,076,592 ක් එනම් සියයට 67 ක් දක්වා අඩු වී තිබුණි. ළගාකර ගත නොහැකි වී තිබුණු ආදායමේ ප්‍රතිශතය අඩුවීම හොඳ ප්‍රවණතාවයක් වුවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ අපේක්ෂිත අලෙවි ආදායම පිළිවෙලින් රු.47,158,525 කින් හා රු.26,682,565 කින් අඩුවෙන් සැලසුම් කිරීම එයට හේතුවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය අංශය වෙත නිෂ්පාදන වර්ග 100 කට අදාළ ඒකක 40,230 ක හා මිලි ලීටර් 54,032 ක ඉල්ලුම සපුරාලිය නොහැකිවීම හේතුවෙන් සංස්ථාවට අහිමි වී තිබුණු ආදායම රු.106,695,025 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එලෙස අහිමිවී තිබුණු ආදායම රු.93,933,125 ක් විය. අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයකින් තොරවම රාජ්‍ය අංශයෙන් ලැබෙන මෙම ඉල්ලුම සපුරාලිය නොහැකිවීම තුළින් නිශ්චිත වෙළඳපොල කොටස අත්හැරියාමේ අවදානමක් පැවතුනි.

(ඉ) 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගැනීම සඳහා කිරි පට්ටි පවත්වාගෙන යෑම හා ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම, මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) නව ඖෂධ නිෂ්පාදන 10 ක් විවෘත වෙළෙඳපොලට හඳුන්වාදී ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස රු.7,521,992 ක් වැයකර ඉසිවර ඔසු දොරට වැඩීම නමින්වූ උළෙලක් 2015 වර්ෂය තුළදී පවත්වා තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මුළු වියදමෙන් සියයට 71 ක් එනම් රු.5,399,970 ක් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැයකර තිබුණු නමුත් නව නිෂ්පාදන එකක් පමණක් හඳුන්වාදී තිබුණු අතර පැරණි නිෂ්පාදන 09 ක ඇසුරුම් නවීකරණය කර ඉදිරිපත් කර තිබුණි.

(ii) සම්ප්‍රදායික ආයුර්වේද ඖෂධ අලෙවි කිරීමේ රාජ්‍ය වෙළඳපොල ආරක්ෂා කර ගන්නා අතරම විවෘත වෙළඳපොල අවස්ථා සොයා ගැනීම තුළින් නව නිෂ්පාදන හරහා සංස්ථාවේ අලෙවි ආදායම සියයට 50 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර තිබුණද 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 17 කින් පමණක් වර්ධනය වී තිබුණු අලෙවි ආදායම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 09 කින්ද, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 04 කින්ද පමණක් වර්ධනය වී තිබුණි.

(iii) ව්‍යාපෘති යෝජනාව සහිත වාර්තාවට අනුව, එක් එක් නව නිෂ්පාදනයෙන් අපේක්ෂිත සමස්ත වාර්ෂික ආදායම හා වියදම පිළිවෙලින් රු.33,000,000 ක් හා රු.25,000,000 ක් වූයෙන් අපේක්ෂිත වාර්ෂික ලාභය රු.8,000,000 ක් විය. එසේ වුවත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2015 ජූනි සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 2 මාස 06 ක කාලපරිච්ඡේදය තුළදී මෙම ව්‍යාපෘතියෙන් උපයා ගෙන තිබුණු සත්‍ය ලාභය රු.5,968,137 ක් පමණක් වූයෙන් ව්‍යාපෘති අරමුණු අපේක්ෂිත පරිදි ඉටුකර ගැනීමට අපොහොසත්වී තිබුණු බව නිරීක්ෂණය විය.

(උ) අලෙවි ප්‍රවර්ධනය ප්‍රචාරණය සමග ඔසු වගා දිරිගැන්වීම පිළිබඳව ලක්ෂ 08 ක ජනතාවක් දැනුවත් කිරීම, වෙළඳපොල සමීක්ෂණයක් පැවැත්වීම හා ඉකුත් වර්ෂයේ අලෙවි ආදායම හා ලාභය පිළිවෙලින් රු.41,190,000 කින් හා රු.10,290,000 කින් ඉහළ නැංවීම අරමුණු

කොට ගෙන, දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය කිරීම සඳහා මසකට අවම වශයෙන් දිස්ත්‍රික්ක 02 ක වැඩමුළු පැවැත්වීමේ ව්‍යාපෘතියක් 2016 වර්ෂයේදී හඳුනාගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් 2016 ජුනි 09 දින රු.10,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. කෙසේ වුවත් ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික්ක 10 ක වැඩමුළු 33 පමණක් පවත්වා තිබුණු අතර එම වැඩමුළු, සාමාන්‍ය අලෙවිකරණ උපක්‍රමයක් ලෙස සංස්ථා නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීම සඳහා පමණක් පැවැත්වූ වැඩමුළු වන බව විගණනයේදී අනාවරණය විය. එසේම 2017 දෙසැම්බර් 31 දින වන විටත් වෙළඳපොල සමීක්ෂණයක් පවත්වා නොතිබුණු අතර අපේක්ෂිත අලෙවි ආදායම හා ලාභ වැඩිකර ගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1973 ඖෂධාගාර නියෝග අංක 21 ප්‍රකාරව, මහජනයාට විකිණීමට තිබෙන යම් ඖෂධයක් සකස් කිරීමේ සෑම සූත්‍රයක්ම එම කාර්යය සඳහා පත් කරන ලද සූත්‍ර කමිටුව මගින් පළමුව අනුමත කරගත යුතු වුවත්, සංස්ථාව විසින් නව නිෂ්පාදන ලෙස 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂවල වෙළඳපොලට හඳුන්වාදී තිබුණු ඖෂධ වර්ග 12 ක් සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටු අනුමැතිය 2018 මාර්තු 31 දින වන විටත් ලබා නොගෙන වෙළඳපොලේ අලෙවි කර තිබුණි.

(ආ) රාජ්‍ය අංශයට ණයට විකුණුම් සඳහා ණය කොන්දේසි පිළියෙල කර නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට රු.163,274,470 ක් වූ රාජ්‍ය අංශ ණය අයකර ගැනීම මන්දගාමී හා දුර්වල තත්ත්වයක පැවතුනි.

(ඇ) ජංගම අලෙවියට අදාළ උපරිම ණය සීමාව රු.5,000 ක් විය යුතු බවත්, උපරිම ණයගැති කාල සීමාව දින 21 ත් දින 30 ත් අතර විය යුතු බවත් 2015 ජුනි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් එම තීරණයට පටහැනිව අදාළ කොන්දේසි උල්ලංඝණය කරමින් ණයට විකුණුම් සිදුකර තිබීමෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවා ගත නොහැකිව තිබුණු ජංගම අලෙවි මුළු ණය ශේෂය රු.3,799,218 ක් විය. තවද පෞද්ගලික අංශයට සිදු කරන ණයට විකුණුම් පිළිබඳව නිර්නය කරන ලද කොන්දේසි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) රජයේ බැංකු දෙකක පවත්වා ගෙන යන ජංගම ගිණුම් දෙකකට අදාළ 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව, වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවූ තැන්පතු රු.337,010 ක් හා රු.224,168 ක් විය. මෙම වටිනාකම තුළ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් රු.22,450 ක්ද, බැංකු ගත නොකළ මුදල් රු.16,633 ක්ද හා පෙර සිට පැවත එන වෙනස්කම් රු.297,927 ක්ද ඇතුළත්වී තිබුණි. මේ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) රු.7,316,876 ක් වැයකර යුනානි ඖෂධ මිලදී ගැනීම, රු.1,513,456 ක් වැයකර වියලි මිදි කිලෝග්‍රෑම් 2,230 ක් මිලදී ගැනීම, රු.168,000 ක් වැයකර මී ඉටි කිලෝග්‍රෑම් 200 ක් මිලදී

ගැනීම, රු.1,995,000 ක් වැයකර අශුද්ධ ගුගුල් කිලෝග්‍රෑම් 1,500 ක් මිලදී ගැනීම යන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු මූලික විමර්ශන වාර්තා 2016 හා 2017 වර්ෂයන් තුළදී සංස්ථාව වෙත ලැබී තිබුණද, ඒ පිළිබඳව අමාත්‍යාංශ විමර්ශන කමිටුව විසින් ලබාදී තිබුණු තීරණ 2018 මාර්තු 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) 1976 සැප්තැම්බර් 06 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කර තිබුණු පහතින් විස්තර දැක්වෙන ප්‍රධාන ඖෂධාගාර නියෝග 08 කට පටහැනිව ඖෂධාගාරය පවත්වා ගෙන යමින් පැවතුනි.

(i) හොඳින් වාතාශ්‍රය හා මැනවින් ආලෝකය ලැබෙන ලෙස ඖෂධාගාරය පවත්වා ගත යුතුවීම.

(ii) මතුපිට මනාව පිළියෙල කළ මේස භාවිතා කර ඖෂධ මිශ්‍ර කිරීම, කැපීම හා ශුද්ධ කිරීම.

(iii) ඖෂධ නිෂ්පාදනය සඳහා උපයෝගී කරගන්නා බෙහෙත් බඩු මනාව ගබඩා කිරීම.

(iv) වැසිකිලි, කුණු වලවල් හා පොහොර ගොඩවල්වලින් අඩි 50 ක් වත් බැහැර වන ලෙස ඖෂධාගාරය පවත්වා ගෙන යාම.

(v) ඖෂධාගාරයේ බිත්ති සහ පෝරුවියන වර්ෂයකට දෙවරක් හුණු ගා සුදු කළ යුතුවීම.

(vi) ඖෂධාගාරයේ ගෙබිම, බිත්තිවල පිගන් ගඩොල් යෙදූ කොටස්, මේස හා සෙසු බඳුන් දිනපතා සේදීම.

(vii) බෝවන රෝගයකින් පෙලෙන හෝ මෑතකදී පෙළුන නිෂ්පාදනාගාරයේ සේවය කරන අයෙකු නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන කටයුතු වල නොයෙදීමට විධිමත් නීතිරීති සම්පාදනය කළ යුතුවීම.

(viii) ඖෂධ නිෂ්පාදනයේ යෙදීමට පෙර අත් සෝදා, හිස්වැසුම් හා ළය ආවරණය කරන සුදු පිරිවැස්මක් භාවිතා කර නිෂ්පාදනාගාරය හා නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාම.

(උ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග සඳහා වූ අයවැයගත ප්‍රතිපාදනය රු.1,500,000 ක් වුවද එය රු.1,171,622 කින් ඉක්මවා පරිත්‍යාග සඳහා වැයකර තිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට අලෙවි මධ්‍යස්ථාන 15 ක හා ගබඩා දෙකක පැවති භාවිතයට ගත නොහැකි හා කල් ඉකුත් වූ පිරිවැය රු.1,949,672 ක් වූ නිමි ඖෂධ තොගය ලාභයට එරෙහිව කපා හැරීමට කටයුතු නොකර වර්ෂය අවසන් ඉතිරි තොගය තුළ ඇතුළත් කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2010 නොවැම්බර් මාසයේ සිට වගා කිරීම ආරම්භකර තිබුණු නිකවැරටිය ඔසු උයනේ අක්කර 52 ක් වූ භූමියෙන් වගාකළ හා වගා නොකළ භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර ඔසු උයනේ නව ඖෂධ වගා කිරීම්, වියළි ඖෂධ ලබා ගැනීම් ආදිය ඇතුළත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළදී මූලධන වියදම් වෙනුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.206,000,000 කින් සියයට 40 ක් වූ රු.82,785,607 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) රජයේ බැංකු දෙකක පවත්වා ගෙන යන ජංගම ගිණුම් තුනක සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය මුදල් ශේෂ පිළිවෙලින් රු.43,748,993 ක්, රු.35,411,520 ක් හා රු.109,946,431 ක් විය. එසේම 2017 දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය 7.39 ක් වූ අතර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හැර ඉතිරි මුදල් පොලී ආදායම් ලැබෙන කෙටිකාලීන ආයෝජනවල තැන්පත් කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ ආරක්ෂක නියාමක තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව පුද්ගලයින් 11 දෙනෙකු ස්ථිර පදනමින් හා එක් පුද්ගලයෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන 2015 වර්ෂයේ සිට සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී එකතුව රු.10,015,761 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිෂ්පාදන සහායකවරු 02 දෙනෙකු, කළමනාකාර සහකාරවරු 03 දෙනෙකු, රියදුරන් 04 දෙනෙකු හා එක් කම්කරුවෙක් 2015 වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී එකතුව රු.21,172,718 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) එම්ජ් 1-1 සේවා ගණයේ වැටුප් ලබමින් ස්ථානභාර නිලධාරී තනතුරු දැරූ නිලධාරීන් 03 දෙනෙකු, අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ සහකාර කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) තනතුරු සඳහා 2015 ජූනි මාසය තුළදී උසස්වීම් ලබා දෙමින් ජේඑම්1-1 සේවා ගණයේ වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. 2015 ජූනි මාසයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මෙම නිලධාරීන් 03 දෙනා වෙත රු.446,741 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඈ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර සඳහා පැවතිය යුතු, උපාධිය ලැබීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක වර්ෂ 12 ක සේවා පළපුරුද්ද වෙනුවට වෙළඳ ආයතනයක වර්ෂ 07 ක සේවා පළපුරුද්ද සහිත අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වන ලෙසට පුවත්පත් දැන්වීම් පලකර 2016 අප්‍රේල් 01 දින සිට වර්ෂයක කාලයකට සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර සඳහා වෙළඳ ආයතනයක වර්ෂ 07 ක සේවා පළපුරුද්ද පමණක් ඇති අයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර පසුව සේවා කාලය 2019 මාර්තු 31 දින දක්වා දීර්ඝකර තිබුණි.

(ඉ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 26 ක වැඩ බැලීමට එම තනතුරු සඳහා සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරීන් 26 දෙනෙකු පත්කර 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී එකතුව රු.2,237,571 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඊ) සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව, මානව සම්පත් කළමනාකරණය / නීතිය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය, සහකාර සමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්) තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකම වුවද, එම මූලික සුදුසුකම සපුරා නොතිබුණු කලා උපාධිධාරියෙකු එම තනතුරට සමාලෝචිත වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

(උ) කළමනාකරු (සැලසුම්) හා කළමනාකරු (සැපයුම්) යන තනතුරු දෙක සඳහා වූ බඳවාගැනීමේ පරිපාටියට අනුව තිබිය යුතු ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද සපුරා නොතිබුණු නිලධාරීන් දෙදෙනෙකු එම තනතුරු දෙක සඳහා සමාලෝචිත වර්ෂයේදී බඳවා ගෙන තිබුණි. තවද සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා වූ බඳවාගැනීමේ පරිපාටියට අනුව තිබිය යුතු රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වර්ෂ 12 ක සේවා පළපුරුද්ද සපුරා නොතිබුණු නිලධාරියෙකු එම තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

## 4.6 වෙළඳපොළ කොටස

----------------------

ආයතනය විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරගකාරී ආයතන අතර ආයතනයේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් ආයතනය සතුව නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

---------------------

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.
ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සංස්ථාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------

### 6.1.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව, අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ

එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

(ආ) කොළකැඳ මිලදී ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන් දෙදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.1,893,102 ක් ගෙවීම් කර තිබුණද සැපයුම්කරුවන් තෝරාගත් ආකාරය විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ඔවුන් දෙදෙනා සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.139,951,018 ක් වූ සිව්මහල් ගබඩා සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 ජූලි 12 දින සිට ඉදිකරමින් පවතින ගබඩා සංකීර්ණය සම්බන්ධයෙන් 2016 ජුනි 01 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමග එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව 2017 ජනවාරි 20 දින වන විට ඉදිකිරීම් වැඩ නිම කළ යුතු වුවත්, 2018 මාර්තු 31 දින වන විටත් වැඩ නිමකර ගොඩනැගිල්ල භාරදී නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කාලය දීර්ඝ කර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු අය කිරීම පිළිබඳව කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු බැවින් ප්‍රමාද ගාස්තු අයකර ගත නොහැකිවී තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම සඳහා ලබාගෙන තිබුණු රක්ෂණ ආවරණ ඔප්පුව 2017 අප්‍රේල් 30 දින වන විට කල් ඉකුත්වී තිබුණු නමුත් එය අළුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිතව ඉදිකිරීම් සැලසුම්කර නොතිබීම හේතුවෙන් වර්ග අඩි 28,500 ක ඉඩකඩ සහිත මහල් හතරකින් සමන්විත මුළු ගොඩනැගිල්ලේ 2 වන මහල තුළ පමණක් සමස්ථ ගොඩනැගිල්ල සඳහා කාන්තා වැසිකිලි 04 ක් හා පිරිමි වැසිකිලි 04 ක් පමණක් ඉදිකර තිබුණි.

(iv) සංස්ථාව විසින් මිලදී ගෙන තිබුණු වතුර පිල්ටර් 02 ක්, පුටු හා මේස සහ සේවක අංක සහිත කැබිනට් ආදී භාණ්ඩ ඉදිකරමින් පවතින මෙම ගොඩනැගිල්ල තුළ අනාරක්ෂිතව තබා තිබුණු බව 2017 නොවැම්බර් 13 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.32,000,000 ක් වූ නිෂ්පාදනාගාරයේ ප්‍රධාන වහල වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 28 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, 2018 පෙබරවාරි 28 දින වන විටත් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු අතර වැඩ ආරම්භකරද නොතිබුණි.

(ඇ) මුළු පිරිවැය රු.16,310,000 ක් වූ ලීටර් 600 ධාරිතාවයෙන් යුත් බොයිලින් පෑන්ස් 02 ක්, විද්‍යුත් වියලන යන්ත්‍ර 02 ක් සහ ග්‍රැනයිට් වර්ගයේ ඇඹරුම් ගල් 04 ක් සපයා, සවිකර ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 6.3.6 ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණි.

(ii) 2017 ඔක්තෝබර් 18 දින නිකුත් කර තිබුණු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය ප්‍රකාරව, 2018 ජනවාරි 18 දින උපකරණ සියල්ල සපයා, සවිකර අවසන් කළ යුතු නමුත් 2018 පෙබරවාරි 28 දින වන විටත් උපකරණ සපයා නොතිබුණි.

(iii) මෙම කොන්ත්‍රාත් කාර්යයට අදාළව ලබා ගෙන තිබුණු කාර්යසාධන සුරක්ෂණ දෙක පිළිවෙලින් 2018 පෙබරවාරි 26 දිනත් 2018 මාර්තු 20 දිනත් කල් ඉකුත්වී තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, 2018 පෙබරවාරි 28 දින වන විටත් කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඈ) මුළු පිරිවැය රු.1,749,500 ක් වූ නව ගබඩා සංකීර්ණයේ වියලි හා අමු ඖෂධ ගබඩා කිරීම සඳහා ස්ටෙන්ලස් ස්ටීල් බහාලුම් 25 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණු අතර 7.5 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු වලංගු කාලසීමාවෙන් සියයට 50 කාලයක් තුළදී ඇගයීම් කමිටු වාර්තා සම්පූර්ණ කළ යුතු නමුත් දින 27 ක් ප්‍රමාදවී තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාදී තිබුණි.

(ii) 2018 පෙබරවාරි 05 දින තෝරාගත් සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, කොන්ත්‍රාත් ලියවිලිවල හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපියේ සඳහන් පිරිවිතරවල වෙනස්කම් පවතින බැවින් එය නිරාකරණය කර දෙන මෙන් ඉල්ලා 2018 පෙබරවාරි 14 දින සැපයුම්කරු විසින් ලිපියක් එවා තිබුණු නමුත් සංස්ථාව ඊට ප්‍රතිචාර දක්වා නොතිබුණු අතර අදාළ සැපයුම සිදුකර නොතිබියදී 2018 මාර්තු 06 දින වන විට ලංසු සුරක්ෂණය කල් ඉකුත්වී තිබුණි.

(ඉ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.10,000,000 ක් වූ ප්‍රධාන නිෂ්පාදනාගාර ගොඩනැගිල්ලේ විදුලි සැපයුම් පද්ධතිය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව (Designing of new electricity distribution system for the main factory of SLADC) පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිවැරදි හා තාත්වික ඇස්තමේන්තුවක් පිළියෙල නොකර හදිසි අවශ්‍යතාවක් ලෙස සළකා අධි ඇස්තමේන්තුවක් පදනම් කර ගෙන රු.10,000,000 ක අයවැය ප්‍රතිපාදනයන් සලසා ගෙන තිබුණු නමුත් කොන්ත්‍රාත්තුව ප්‍රදානයකර තිබුණු වටිනාකම රු.84,000 ක් පමණක් විය.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 27 ප්‍රකාරව, එක් සාමාජිකයෙකු එක් වරකට තාක්ෂණික ඇගයීම් කමිටු 03 කට වඩා වැඩි ප්‍රමාණයකට පත් නොකළ යුතු නමුත්, සංස්ථාව විසින් මෙම ප්‍රසම්පාදනය ඇතුළු ප්‍රසම්පාදන 04 කට කාර්මික

ඉංජිනේරු (සෞඛ්‍ය අමාත්‍යාංශය), සහකාර සාමාන්‍යාධිකාරි (කර්මාන්තශාලා), කළමනාකරු (මූල්‍ය) යන තනතුරු දරන නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 6.3.6 ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණු අතර ප්‍රසම්පාදනය ආරම්භකර අවසන් කිරීමට වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි.

(ඊ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.2,533,642 ක් වූ වර්ෂ 05 ක් සඳහා තාවකාලික පදනමට සංස්ථාවට පවරා ගත් ගොඩනැගිල්ල පිළිසකර කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව 2017 අප්‍රේල් 20 දින ප්‍රථමවරට ව්‍යාපාර නාමය ලියාපදිංචි කර තිබුණු සේවා පළපුරුද්ද මාස 07 ක පමණ කාලයකට සීමා වූ ලංසුකරුවෙකු තෝරා ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව, පිළිගත හැකි අත්තිකාරම් ඇපකරයක් ලබා නොගෙන කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් වූ රු.458,434 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබුණි. එමෙන්ම 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක් වූ රු.126,682 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

## 6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් අයිතම 06 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 8 සිට සියයට 35 දක්වා පරාසයකද සහ වියදම් අයිතම් 50 කින් වියදම් අයිතම 15 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 5 සිට සියයට 117 දක්වා පරාසයකද අවාසිදායක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත් 2018 ජුනි 30 දින වන විටත් නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහතින් දැක්වේ.

(අ) රසායනාගාර වාර්තාව සහ වෛද්‍ය කමිටු වාර්තාව මගින් ප්‍රතික්ෂේපවී තිබියදී රු.1,980,000 ක් වටිනා මී පැණි කිලෝ ග්‍රෑම් 4,000 ක් 2012 ජුනි මාසයේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර මෙම මිලදී ගැනීමට අදාළ වවුචර්, ලදුපත් හා අදාළ ලිපි ගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. 2018 ජුනි 30 දින වන විට එම මී පැණි පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

(ආ) සංස්ථාව තුළ රු.5,930,284 ක වියදමින් නිෂ්පාදනය කළ හැකිව තිබුණු අභ්‍රක භෂ්ම හා නාග භෂ්ම කිලෝ ග්‍රෑම් 200 ක් රු.7,137,130 ක් වැය කර 2012 වර්ෂයේදී ආනයනය කිරීම නිසා රු.1,206,846 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඈ) නවදිල්ලි නුවර ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලය තුළ දේශීය වෛද්‍ය කටයුතු සඳහා කාර්යාලයක් ලබාගෙන අළුත්වැඩියාව හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා 2012 ඔක්තෝබර් 15 දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත රු.3,000,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණි. අත්තිකාරම් ලබාදී වර්ෂ 5ක් ගතවී ඇතත්, අදාළ අරමුණ ඉටුකර ගත නොහැකිවී තිබුණි.

(ඇ) සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩමක 2009 වර්ෂයේදී රු.1,808,795 ක් වැය කර ආරක්ෂිත වැටක් ඉදිකර තිබුණු අතර නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට යෝජිත මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | තොග පාලනය | උපරිම, අවම හා යලි ඇණවුම් තොග මට්ටම් තීරණය කර තිබුණද ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර නොතිබීම, තොග ක්‍රමානුකූලව ගබඩා නොකිරීමෙන් මුලින් ලැබීම් මුලින් නිකුත් කිරීම් ක්‍රමය මත තොග නිකුත් කිරීම් සිදුකර නොතිබීම, වර්ෂය අවසන් තොග වටිනාකම පොත් අගය පදනම් කරගෙන ගණනය කිරීමෙන් පසු භෞතික තොගයේ වටිනාකම සමග සසඳා තොග අතිරික්තතා හා ඌනතා මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබීම. |
| (ආ) | ගබඩා පාලනය | බෝතල් ගබඩාකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම හා නිෂ්පාදනාගාර ගොඩනැගිල්ල තුළ අපිරිසිදු විදුරු බෝතල් විශාල ප්‍රමාණයක් ගොඩගසා තිබීම. |
| (ඇ) | ගිණුම්කරණය | ණයහිමි හා ණයගැති පාලන ගිණුම් පවත්වා නොතිබීම. |
| (ඈ) | වියදම් පාලනය | (i) අත්තිකාරම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබීම, නිරතුරුවම පරීක්ෂාවට ලක් නොකිරීම හා ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් නොකිරීම.<br>(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කාර්යාල බෑග් මිලදීගෙන අදාළ නිලධාරීන් වෙත බෙදාදීම වෙනුවට නිලධාරීන් වෙත තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම. |